සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
චක්‍රලේඛ ලිපි අංක 17/2025

මගේ අංකය :- PPSC/ES/06/FI/06/12
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභාව,
නවනගරය, රත්නපුර.
2025.07. 11

1. ලේකම්,
ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම,
සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ
ධීවර කටයුතු අමාත්‍යාංශය.
සබරගමුව පළාත් සභාව.

2. පළාත් ඉඩම් කොමසාරිස්,
සබරගමුව පළාත් සභාව.

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියේ නිලධාරින්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

උක්ත විභාගය සඳහා මින් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම චක්‍රලේඛ ලිපිය මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන අදාළ නිලධාරීන්ගේ දැන ගැනීම සඳහා යොමු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. මෙම විභාගය 2025 අගෝස්තු මාසයේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

04. බඳවා ගැනීමේ පරිපාටියට අනුව මෙම විභාගයේ විෂය නිර්දේශය පහත සඳහන් වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ II, IV, V, VII, XII, XIII වන ඡේද | පැය 01 1/2 | 100 | 40 |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ I, II, III, IV, VI, VIII පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය | පැය 01 1/2 | 100 | 40 |

05. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ www.psc.sg.gov.lk හා සබරගමුව පළාත් වෙබ් අඩවියේ www.sg.gov.lk** පළ කර ඇත.

06. **විභාගයට අයදුම්කිරීම -** අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය පෞද්ගලික ලිපි ගොනුව නඩත්තු කරන කාර්යාලයේ / දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් හා අදාළ අමාත්‍යාංශයේ ලේකම් මගින් 2025.07.31 දින හෝ එදිනට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය.

07. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. **මෙම විභාගය සඳහා අයදුම්කරුවන් ඉදිරිපත්ව**

<u>නොමැති නම් විභාගයේ ඉදිරි කටයුතු කිරීමට ප්‍රථමයෙන් ඒ පිළිබඳව ද කඩිනමින් මෙම කොමිෂන් සභාව දැනුවත්</u> කරන මෙන් කාරුණිකව දන්වමි.

08. මීට පෙර මෙම විභාගයට පෙනී සිට එම අවස්ථාවේ විභාගය අසමත් වී නැවත අයදුම්කරන්නේ නම් රු **600/-**ක, විභාග ගාස්තුවක් ගෙවිය යුතු වේ. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. එම මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ පිටුපස නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

09. විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට විභාගය පවත්වන දිනය, ස්ථානය හා වේලාව විභාග ප්‍රවේශ පත්‍ර මගින් යථා කාලයේ දී දැනුම් දෙනු ලැබේ.

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කරුණක් පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ඩබ්.ආර්. දිනිෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත :- ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත. - කාරුණික දැන ගැනීම සඳහා

**ආදර්ශ අයදුම්පත්‍රය**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියේ නිලධාරීන්ගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025**

01. (a) මුලකුරු සමඟ නම:-

.............................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (මුලකුරු අගට යොදන්න. උදා:- SILVA A.B.)

(b) මුලකුරු සමඟ නම:-
(සිංහලෙන්)

.............................................................................................................................

(c) සම්පූර්ණ නම:-

.............................................................................................................................

(d) රාජකාරී ලිපිනය:-

.............................................................................................................................

(මෙම ලිපිනයට ප්‍රවේශ පත්‍ර තැපැල් කරනු ලැබේ.)

(e) ස්ත්‍රී / පුරුෂ භාවය:-..........................................................................

(f) දුරකථන අංකය පෞද්ගලික:- ..........................................................

(g) දුරකථන අංකය රාජකාරි :- .............................................................

(h) මීට පෙර මෙම විභාගයට පෙනී සිටියේද යන්න- ................................

02. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. සහකාර ඉඩම් කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) III ශ්‍රේණියට පත්වූ දිනය:-....................................

04. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට යටත්වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:-

.........................................................

(අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන)

---

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ..........................................................................................මහතා/මහත්මිය/මෙනවිය .............................. දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත් / නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අමුණා ඇති බවත් සහතික කරමි. ඉහත අංක 01 සිට 04 තෙක් අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අයදුම්කරුට / අයදුම්කාරියට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසකම් ඇති/නැති බවත්, සහතික කරමි.(සහතික නොකරන්නේ නම් හේතු දක්වන්න)

.............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන, පදවි නාමය
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

දිනය: .........................